**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 12 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 955.70 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 568.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 386.71 ක් හෙවත් සියයට 40.46 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 351.50 | 340.53 | 10.97 | 3.12 |
| මූලධන | 604.20 | 228.46 | 375.74 | 62.19 |
| **එකතුව** | **955.70** | **568.99** | **386.71** | **40.46** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 20 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.මිලියන 603.75 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 593.64 ක් උපයෝජනය කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26.89 | 21.07 | 18.00 | 18.35 | 96.00 | 80.91 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පහත සඳහන් තැන්පත් ගිණුම් 7 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 247.68 ක් විය. විස්තර පහත දැක්වේ.

| පොදු තැන්පතු ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0116/000 | 0.01 |
| 6000/0000/00/0002/0164/000 | 0.42 |
| 6000/0000/00/0013/0118/000 | 81.08 |
| 6000/0000/00/0016/0108/000 | 164.61 |
| 6000/0000/00/0017/0030/000 | 0.91 |
| 6000/0000/00/0018/0108/000 | 0.51 |
| 6000/0000/00/0019/0226/000 | 0.14 |
| එකතුව | **247.68** |

## 2.4 විගණන නිරීක්ෂණය

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ජේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 3 ජේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක් විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | හිගුරක්ගොඩ, මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | තමන්කඩුව හා මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඇ) | මුදල් පොත/සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 446 | තමන්කඩුව, හිගුරක්ගොඩ, මැදිරිගිරිය හා දිඹුලාගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මුදල් පොත් පවත්වා නොතිබුණු අතර, තමන්කඩුව හා මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සුළු මුදල් පොත් පවත්වා නොතිබුණි. |
| (ඇ) | ලැබෙන චෙක්පත්/මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දුරකථන ඇමතුම් ලේඛනය | මුදල් රෙගුලාසි 850(1) | ලංකාපුර, හිගුරක්ගොඩ සහ මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඊ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | ලංකාපුර, හිගුරක්ගොඩ සහ මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (උ) | උපපත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | ලංකාපුර හා මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඌ) | වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනය හෝ රථවාහන වත්කම් ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) හා 2002 අගෝස්තු 23 දිනැති අයිඒඅයි/2002/01 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | හිගුරක්ගොඩ, තමන්කඩුව හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් හෝ රථවාහන වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (එ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | මැදිරිගිරිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ඒ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | හිඟුරක්ගොඩ හා දිඹුලාගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඔ) | දෛනික ලැබීම්/ ගෙවීම් සිහිවටන ගිණුම් | 2002 දෙසැම්බර් 27 දිනැති අංක 157/2002 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | මැදිරිගිරිය හා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |

**3.2 විගණන සාක්ෂි නොවීම**

---------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ගැමිදිරිය ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටුවා ඇති ග්‍රාමීය සංවිධාන ව්‍යාපෘති 27 ක් සඳහා ලබාදි තිබුණු මුදල් පිළිබද තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයේ සිදු වූ දෛනික මුදල් ලැබීම් හා ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් වූ CIGAS වැඩ සටහනේ කිසිදු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2015 වර්ෂය සඳහා CIGAS වැඩ සටහනේ මුදල් පොතේ සංරක්ෂිත පරිගණක ගොනුවද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

**3.3.1 අයවැය විචලනය**

වැය විෂයයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 94 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 20 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් පිළිවෙලින් රු.432,157,157 ක් හා රු.171,590,880 ක් ලෙස එකතුව රු.603,748,037 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.425,186,521 ක් හා රු.168,450,591 ක් වශයෙන් එකතුව රු.593,637,112 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු. 6,970,636 ක් හා රු. 3,140,289 ක් වශයෙන් එකතුව රු.10,110,925 ක් හෙවත් සියයට 1.8 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම්**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 29,717,141 ක් වූ තැන්පතු 71 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 27501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂවල එකතුව රු. 2,294,209 ක්වූ අතර, එම ණය ශේෂය තුළ වූ රු. 1,085,430 ක් වූ හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් වර්ෂ 10 කට අධික කාලයක් මුළුල්ලේ හිඟහිටිව පැවැති රු.293,090 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡෙදයේ 4.2.5 උපවගන්තියට අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් බැහැරට ස්ථානමාරුවී ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතු රු.1,192,956 කින් රු.819,656 ක් වූ ණය ශේෂ 6 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 2 ක් දක්වා කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) සේවය අතහැර ගිය නිලධාරින් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.165,895 ක ණය ශේෂ වර්ෂ 2 ක සිට වර්ෂ 6 ක් දක්වා කාලයක සිට හිඟහිට පැවැති අතර එම ශේෂ අයකර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 3.6.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

-------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. .

### 3.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබාගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රුපියල් මිලියන 206.5 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.6.3 අභ්‍යන්තර විගණනය

-------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මකව පවතින නමුත් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිළිබඳව අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් කර නොතිබුණි.

### 3.6.4. වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 වර්ෂය සඳහා වූ එම වාර්තාව 2016 ජුලි 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

----------------------------

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය | |
|---|---|---|---|---|
| | | | වර්ෂ 01 කට වැඩි 03ට අඩු | වර්ෂ 03 කට වැඩි |
| (i) | ගොඩනැගිලි | 12 | 09 | 03 |
| (ii) | මෝටර් වාහන (යතුරු පැදි) | 03 | 03 | - |
| (iii) | යන්ත්‍ර සූත්‍ර | 14 | 14 | |
| | **වෙනත් වත්කම්** | | | |
| (iv) | වයිට් බෝඩ් | 03 | - | 03 |
| (v) | C.D.M.A දුරකථන | 13 | - | 13 |
| (vi) | විධායක නිලධාරී ගමන් බෑග් | 13 | - | 13 |
| (vii) | දැල් ගෘහ (Net House) | 01 | - | 01 |
| (viii) | මැනුම් උපකරණ කට්ටල | 01 | 01 | - |

(ii) ඇලහැර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දිවි නැගුම ප්‍රජා මූල බැංකුව යටතේ පවතින බැංකු ගිණුම් 2156 ක එකතුව රු.11,475,306 ක ශේෂයක් වර්ෂ 2 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර, එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2016 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් රජයේ නිවාස සහ ඊට අයත් ඉඩම් පිළිබඳව සමාලෝචිත වර්ෂයේ හා පූර්ව වර්ෂවලදී වාර්ෂික සමීක්ෂණයන් සිදුකර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සියළුම වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

----------------------------------------

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල නිවාසයක් සිවිල් ආරක්ෂක බලකායේ කාර්යාලයක් පවත්වාගෙනයාම සඳහා 2008 මාර්තු 21 දින සිට 2013 සැප්තැම්බර් 10 දින දක්වා ගිවිසුම්ගතව ලබාදී තිබුණි. ගිවිසුම් කාලයෙන් පසුව එම නිවස ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2013 සැප්තැම්බර් මාසයේ සිට 2016 ජුලි මාසය දක්වා අයවිය යුතු රු. 23,688 ක කුලිය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.8 අනුකූල නොවීම්**

------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| (i) XII පරිච්ඡේදයේ 22.3 උපවගන්තිය | - | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකුගේ වැටුප් රහිත නිවාඩු දින 35 ක් ගණනය කිරීමේදි සති අන්ත හා රජයේ නිවාඩු දිනයන් සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 4.4 උප වගන්තිය | - | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසවලින් නිවාස 13 ක්, වෙනත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් වෙත ලබාදී තිබුණු අතර, ඒ සඳහා නිවාස කමිටු අනුමැතිය හෝ ලබා ගෙන නොතිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 6.1 උප වගන්තිය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් පොදු සේවා නිවාසවල පදිංචි නිලධාරීන් 07 දෙනෙකුගේ බදු කාල සීමාව වූ වසර 05 ක කාලය ඉක්මවා, දීර්ඝ කාලයක් තිස්සේ එම නිවාසවල පදිංචිව සිටින බව නිරීක්ෂණය විය. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**-----------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 104(1)(අ) | - | ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයට 2014 ජූනි 27 දින සිදු වී තිබුණු අනතුර සහ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයට 2014 නොවැම්බර් 22 දින හා 2015 පෙබරවාරි 19 දිනවල සිදු වී තිබුණු අනතුරු පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 115 | 104,079 | අනුමැතිය ලබා ගැනීමකින් තොරව රාජ්‍ය ආයතනවලට පළතුරු පැල සැපයීම වෙනුවෙන් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 396 | 873,871 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 ක් විසින් නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කර නොමැති, කාලය මාස 6 ඉකුත් වූ එකතුව රු.873,871 ක් වූ චෙක්පත් 47 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 751(i) | - | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබෙන රු.109,153 ක් වූ භාණ්ඩ හා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබුණු ජල ටැංකි 65 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. එසේම ආපදා කළමනාකරණ අංශයට ලැබී තිබුණු තුවා 81 ක තොගයක්, ඉහුම් |

| | | |
|---|---|---|
| | | පිහුම් කට්ටල 20 ක් හා ඇඳ ඇතිරිලි 43 ක තොගයක්, තොග ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2015 මාර්තු 10 දිනැති අංක 3/2014(1) දරන චක්‍රලේඛය | 46,599 | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ මාසික රාජකාරි දුරකථන වියදම් සීමාව ඉක්මවා රු. 27,399 ක් වැය කර තිබුණි. |

## 3.9 විදේශාධාර ව්‍යාපෘති

**ව්‍යාපෘති නිම කිරීමෙන් පසු ප්‍රතිලාභ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගැමිදිරිය ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සංවිධාන 157 ක් සඳහා 2014 නොවැම්බර් 30 දින වන විට රු. මිලියන 611.38 ක් ලබාදී තිබුණු අතර, ඒ මත වූ චක්‍රීය ණය මුදල් සම්බන්ධයෙන් කිසිදු පසුවිපරම් සහ අධීක්ෂණයක් වගකිව යුතු නිලධාරීන් විසින් ඉටු කර නොතිබුණි.

(ආ) යළි පිබිදෙමු ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව, ලංකාපුර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල ග්‍රාමීය සංවිධාන 20 ක් වෙත රු.50,648,857 ක් ඉකුත් වර්ෂවලදී ලබාදී තිබුණි. එම මුදල් අපේක්ෂිත අරමුණුවල යෙදවීම සම්බන්ධයෙන් වූ අධීක්ෂණ සහ පසුවිපරම් කටයුතු වගකිවයුතු නිලධාරීන් විසින් ඉටු කර නොතිබුණි.

## 3.10 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම

**මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෑග් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඇරඹීම සඳහා රු. 980,000 ක් වැයකර 2015 වර්ෂයේදී මිලදීගෙන තිබුණු මැෂින් ඇතුළු උපකරණ තොගය අදාළ අපේක්ෂිත අරමුණු වෙනුවෙන් 2016 අප්‍රේල් 30 දින වන විටද යොදාගෙන නොතිබුණි.

(ආ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මැටිවළං හා විසිතුරු භාණ්ඩ නිෂ්පාදන කම්හලක් ආරම්භ කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව රු. 882,000 ක් වැයකර, 2014 දෙසැම්බර් මාසයේදී ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. 2016 අප්‍රේල් මාසය වන විටද අදාළ කර්මාන්තයේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඇ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කොහු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සඳහා 2013 වර්ෂයේදී රු.700,000 ක් වැයකර යන්ත්‍ර උපකරණ මිලදී ගෙන තිබුණි. ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා තවදුරටත් රු.1,794,850 ක් වැය කිරීමෙන් පසු එකතුව රු.2,494,850 ක් ආයෝජනය කර තිබුණි. 2016 අප්‍රේල් මාසය වන විටද, අදාළ නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඈ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 2 ක් සඳහා රු.100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(ඉ) 2015 ගංවතුරින් හානියට පත් සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිවලින් රු.1,008,710 ක් වූ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | **ගැලපුම් පිළිබඳ විස්තරය** | **කාල විශ්ලේෂණය** | | |
|---|---|---|---|---|
| | | **මාස 06ට වැඩි වර්ෂ 01ට අඩු** | **වර්ෂ 1ට වැඩි වර්ෂ 3ට අඩු** | **එකතුව** |
| | | රු. | රු. | රු. |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් | 71,596,339 | 313,537 | 71,909,876 |
| (ii) | හඳුනා නොගත් බැර | 9,838,134 | - | 9,838,134 |
| | **එකතුව** | **81,434,473** | **313,537** | **81,748,010** |

**3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2015 දෙසැම්බර් 31 දින රු.2,759,830 ක් වටිනා චෙක්පත් 22 ක් වෙනුවෙන් 2016 අප්‍රේල් 05 දින නැවත අළුත් චෙක්පත් ලියා තිබුණි. එම නව චෙක්පත් ඇලහැර දිවිනැගුම මූලස්ථානයේ කළමනාකරු භාරයේ තිබුණු බව 2016 අප්‍රේල් 07 දින සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී තහවුරු විය. පිළියෙල කරන ලද චෙක්පත්වලට අදාළ භාණ්ඩ 2016 ජුනි මාසය වන විටත් අදාළ සැපයුම්කරුවන් විසින් සපයා නොමැති බව නිරීක්ෂණය විය.

**3.13 අවිධිමත් ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන ලේඛනය පිටු අංක කර නොතිබුණු අතර පිටු අතහැර සටහන් කිරීමද සිදුකර තිබුණි. ප්‍රසම්පාදන තීරණ 22 ක් සඳහා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් දෙදෙනෙකු අත්සන් කර නොතිබුණ අතර තීරණ 24 ක් සඳහා එක් සාමාජිකයෙකු අත්සන් කර නොතිබුණි. ප්‍රසම්පාදන තීරණයක් පිළිබඳ කිසිදු විස්තරයක් සටහන් නොවූ හිස් පිටුවල ප්‍රසම්පාදන කමිටු සභාපතිවරයා අත්සන් යොදා තිබුණි.

(ii) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වෙළෙඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සඳහා අවශ්‍ය අවම සීමිත මිල ගණන් කැඳවීමද, ලංසු කැඳවීමේදී ලබාදිය යුතු අවම කාලසීමාවට වඩා අඩු කාලයක් ලබාදීමද, විස්තරාත්මක පිරිවිතර නොමැතිව මිල ගණන් කැඳවා තිබීමද, මිල ගණන් කැඳවීමේදී වෙළඳ නාමය සඳහන් කිරීම වැනි නෛතික තත්ත්වයෙන් බැහැරව කටයුතු කර තිබුණි.

(iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කරනු ලබන මිලදී ගැනීම් සඳහා මිල ගණන් කැඳවීම විවිධ අංශ මගින් සිදුකර තිබීම හේතුවෙන් මිලදී ගැනීම් සහ ඒවා සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් තොරව සිදු කර තිබුණි.

(iv) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපන ශාලාව පවත්වා ගෙනයාම සඳහා වාර්ෂිකව මිල ගණන් ලබා ගනිමින් ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. 2010 වර්ෂයේ සිට එක් පුද්ගලයෙක් වෙත ආපන ශාලාව ලබාදී තිබුණි.

**(ආ)** **අධිකාරී බලය නොමැති ගනුදෙනු**

-----------------------------------

2014 මැයි 29 දිනැති අංක පීඑෆ්ඩී/පීඑම්ඩී/ජීඊඑන්/003 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව, ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සඳහා වෙළෙඳපල මිල සැදැහුම් ක්‍රමය යටතේ, රුපියල් මිලියන 1 ක් දක්වා උපරිමයකට යටත්ව භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා අධිකාරී සීමාව සංශෝධනය කර තිබුණි. එයට පටහැනිව ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ රු.3,397,143 ක භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන්, ප්‍රසම්පාදන තීරණ 21ක් මගින් මුළු මිලදී ගැනීම අයිතම කිහිපයකට කොටස් කර, වෙළෙඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කර තාක්ෂණික ඇගයීමකින් තොරව භාණ්ඩ මිලදී ගෙන තිබුණි. එම මිලදී ගැනීම්වලට අදාළව ඉදිරිපත් කර තිබුණු රු.2,669,692 ක් වටිනා බිල්පත් විධිමත් නොවීම, ඉදිරිපත් කළ බිල්පත්වල වටිනාකමට වඩා රු. 170,476 ක් අඩුවෙන් ගෙවීම් කිරීම හා අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් මිලදී නොගැනීම නිසා රු.60,550 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ඇ)** වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,059,795 ක් වටිනා චෙක්පත් 41 ක්ද, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.8,467,503 ක් වටිනා චෙක්පත් 34 ක්ද හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,658,345 ක් වටිනා චෙක්පත් 6 ක්ද, 2015 දෙසැම්බර් 31 දිනට කාර්යාල වෙත සපයා නොතිබුණු භාණ්ඩ සඳහා සහ ඉටුනොකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් චෙක්පත් ලියා තිබුණු අතර, එම චෙක්පත් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2016 මාර්තු 8 දින වන විටත් අත රඳවාගෙන තිබුණි.

**3.14** **මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 මාර්තු 09 දින උඩවෙල උතුර ග්‍රාම නිලධාරී වසමේ සමෘද්ධිලාභීණියක් මියයාම පිළිබඳ විස්තර අදාළ පරිදි වාර්තා නොකිරීම හේතුවෙන් එම සමෘද්ධි සහනාධාරය 2015 වර්ෂය අවසන් වනතුරුම ලබාගෙන තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබී තිබුණු සමෘද්ධි දීමනා පිළිබඳව අදාළ ප්‍රතිලාභියා වෙත දැනුවත් නොකර, එම ගිණුමේ එක් රැස්වී තිබුණු රු. 18,920 ක මුදලක් සාවද්‍ය ලෙස බැහැර කිරීමට ගත් උත්සාහයක් ව්‍යර්ථ වී තිබුණි. ඊට වසම භාර සමෘද්ධි නිලධාරී ඇතුළු බැංකු කළමනාකාරීත්වයේ සම්බන්ධතාවයක් පවතින බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුමට වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණත්, විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 167 - පොත්ගුල් ප්‍රදේශයේ දිවි නැගුම සංවර්ධන නිලධාරිනිය හා පරාක්‍රම සමුද්‍රය දිවි නැගුම ප්‍රජා මූල බැංකු කළමනාකාරිණිය විසින් එක් සාමාජිකයෙකුගෙන් රු. 2,000 ක මුදලක් අනිවාර්ය ඉතිරි කිරීමක් ලෙස තැන්පත් කිරීමට බලපෑම් කර, සාමාජිකයින් 39 දෙනෙකුගෙන් රු 28,550 ක් කිසිදු ලදුපතක් නිකුත් නොකර එකතු කරගෙන තිබුණි. තවද 164 - පරාක්‍රම සමුද්‍රය දිවි නැගුම සංවර්ධන නිලධාරීගේ ලදුපත් පොත පරීක්ෂාවේ දී රු. 16,600 ක් වටිනා ලදුපත් 09 ක් 2015 අප්‍රේල් 14 දින ලෙස, ඉදිරි දින දමා නිකුත් කර තිබුණු බව 2015 අප්‍රේල් 10 දින සිදුකරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

**3.15** **පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයක් 2015 නොවැම්බර් 01 දින අනතුරකට පත්වීමෙන් රු.187,750 ක අලාභයක් සිදුවී තිබුණා. රක්ෂණ ආයතනයක් විසින් රු.115,621 ක වන්දි මුදලක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. ඒ අනුව රු.72,123 ක්වූ අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2013 අගෝස්තු 24 දින අනතුරකට ලක්වීමෙන් රක්ෂණ වන්දි මගින් ආවරණය වී නොතිබුණු රු.149,450 ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණද, 2016 ජුනි මාසය වන විටත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන දෙකක් 1996 වර්ෂයේදී හා 2005 වර්ෂයේදී අනතුරුවලට ලක්වීම හේතුවෙන් පිළිවෙලින් රු.29,225 ක් හා රු.648,625 ක් වශයෙන් වූ අලාභ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

**3.16** **කළමනාකරණ දූර්වලතා**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් අත්තනකඩවල හා ඇලහැර දිවි නැඟුම ප්‍රජා මූල බැංකු 02 ක ගිණුම් තොරතුරු අනුව 223 දෙනෙකුගෙන් අයවිය යුතු රු.42,643,612 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මැදිරිගිරිය හා ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල ගල්වලවල් 25 ක්, ගඩොල් පෝරණු 51 ක් හා බොරළු කැපීමේ ස්ථානයක් සඳහා 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ බලපත්‍ර ලබාගෙන නොතිබුණු බව විගණනය වෙත ලැබුණු ග්‍රාම නිලධාරී වාර්තා අනුව නිරීක්ෂණය විය.

**3.17** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 38 | 33 | 5 |
| (ii) | තෘතීයික මට්ටම | 427 | 232 | 195 |
| (iii) | ද්විතීයික මට්ටම | 568 | 477 | 91 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 103 | 86 | 17 |
| | **එකතුව** | **1,136** | **828** | **308** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කර තිබූ ආර්ථික සංවර්ධන නිලධාරීන් 37 දෙනෙක් වෙත සමාලෝචිත වර්ෂයේ දී ලිඛිතව රාජකාරි පවරා නොතිබුණි.

(ආ) පුරප්පාඩු වී තිබෙන ප්‍රාදේශීය ලේකම් තනතුරු 04 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීමට 2014 සැප්තැම්බර් මාසයේ සිට කටයුතු කර නොතිබුණු අතර එම තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබූ කළමනාකරණ සහකාර සේවයේ නිලධාරී වෙත විධිමත් පත්වීමක් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන ග්‍රාම නිලධාරී තනතුර 2012 වර්ෂයේ සිට පුරප්පාඩු වී තිබුණු අතර 2015 ජනවාරි 01 දින සිට වසරක කාලයක් සඳහා වැඩ බැලීමේ පත්වීමක් ලබා දී තිබුණි. නමුත් ඉන් පසු කාල සීමාව සඳහා කාලය දීර්ඝ කිරීමකින් තොරව අදාළ නිලධාරියාගේ සේවය ලබා ගනිමින් පැවතුණි.

(ඉ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය ස්ථාන මාරුවීමකින් තොරව එකම සේවා ස්ථානයේ වර්ෂ 6 ක සිට වර්ෂ 27 ක් දක්වා පරාසයක කාලයක් සේවය කරන බව නිරීක්ෂණය විය.

(ඊ) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කළමනාකරණ සහකාර නිලධාරීන් 03ක්, සංවර්ධන නිලධාරි 26ක්, සංවර්ධන සහකාර නිලධාරි 02ක්, සංවර්ධන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන් 04ක්, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ කාර්යාල කාර්ය සේවයේ කම්කරු 01ක් හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ කාර්යාල කාර්ය සේවයේ නිලධාරීන් 04 ක් ද වශයෙන් කාර්ය මණ්ඩල 40 ක් අතිරික්තව පැවතුණි.